# 1.13 නිරෝගී භාෂකයකු හා සැසඳීමේ දී ස්කලන රෝගියකුගේ භාෂණයෙහි දක්නට ලැබෙන සුවිශේෂතා පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

පී.ඒ. දිල්මිණී කුමාරි පෙරේරා
වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

හැඳින්වීම :

ගොතගැසීම/ ස්කලනය පුද්ගලයකුගේ කථාව හා කථා ලීලාව හා සම්බන්ධ භාෂණ දුබලතාවකි. එය පුද්ගලයකුගේ මනා භාෂා කුසලතාවට බාධා පමුණුවන්නාවූ භාෂණයේ කාල පරාසය හා ස්වාභාවය වෙනස් කරන්නකි. මෙහිදී භාෂකයා භාෂාව හැසිරවීමේ දී යෙදෙන ශබ්ද වර්ණ, වචන වාක්‍ය, ආදිය තුළ අස්වාභාවික නැවතීමක් හෝ ලොප් වීමක් දක්නට ලැබේ.

ස්කලනය හා සම්බන්ධ ප්‍රධාන හේතුවක් මේ වනතුරු සොයාගෙන නොමැති අතර ඒ හා සම්බන්ධ අප්‍රධාන සාධක හතරකි.

1. කායික හේතු
2. මානසික හේතු
3 .වාග් විද්‍යාත්මක හේතු
4 .පාරිසරික හේතු වශයෙනි.

අරමුණ සහ වැදගත්කම :

සාමාන්‍ය නිරෝගී පුද්ගලයකුගේ භාෂණය හා සැසඳීමේ දී ස්කලනය හා සම්බන්ධ රෝගීන්ගේ භාෂණයෙහි වෙනස්කම් රාශියක් දක්නට ලැබේ මෙම පර්යේෂණයෙහි අරමුණ වන්නේ එම වෙනස්කම් පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් කිරීමයි. මෙහි දී ස්කලනය හා සම්බන්ධ ස්ත්‍රී - පුරුෂ දෙපක්ෂය ම ඇතුළත් වන පරිදි සිංහල භාෂක රෝගීන් දසදෙනෙකුගෙන් ලබා ගත් දත්ත විමර්ශනයට ගැනේ.

මෙම රෝගී තත්වය වෛද්‍ය විද්‍යාව, වාග් විද්‍යාව, සායනික වාග් විද්‍යාව, මනෝවිෂයක වාග් විද්‍යාව යන විෂය ක්ෂේත්‍ර ගණනාවක ම සාකච්ඡාවට බඳුන් ව ඇති හෙයින් මෙම පර්යේෂණය එකී ක්ෂේත්‍රයන්හි නියැලුනට මෙන්ම විශේෂ අධ්‍යාපන ගුරු භවතුන්ට ද කථන හා භාෂණ චිකිත්සකවරුන්ට ද, මනෝවිද්‍යාඥයින්ට ද වැදගත් වේ.

සාමාන්‍ය නිරෝගී පුද්ගලයකුගේ භාෂණය හා සැසඳීමේ දී ස්කලනය හා සම්බන්ධ රෝගීන්ගේ භාෂණයෙහි දක්නට ලැබෙන විශේෂතා :

1. ශබ්ද ලොප් කිරීම,
2. වචන ලොප් කිරීම,
3. වර්ණ ලොප් කිරීම,
4. වාක්‍ය ලොප් කිරීම.